

### අදීන ලේඛකයකුගේ මතක සංග්‍රහය

# පිරිමි ජාතිය උතුම් ජාතිය

''ඇගේ වෘත්තිය තෝරා ගැනීමෙහි ලා අප මෙහෙයවන ප්‍රධාන සාධකය විය යුත්තේ මිනිස් වර්ගයාගේ ශුභ සිද්ධිය හා අපගේ පිරිපුන් බවයි. මෙම අවශ්‍යතා දෙක අතර ගැටුමක් ඇති වන්නේ යැයි නොසිතිය යුතුය.....''

මා ඉහත පාඨය උපුටා ගත්තේ, මේ වන විට අගනා සාර්ගර්භ මෙන්ම සිත්බඳනා කෘති 50 කට අධික සංඛ්‍යාවක් රචනා කිරීමෙන්ද පර්වර්ථනය කිරීමෙන්ද නමක් දිනා සිටින ඩී. බී. කුරුප්පු සාහිත්‍යධරයාගේ නවතම කෘතිය වූ පිරිමි ජාතිය උතුම් ජාතිය නම් ග්‍රන්ථයෙනි. ග්‍රන්ථයේ නාමය තුළම විවාදාපන්න ආකල්පයක් ගැබ්ව ඇති බව බැලූ බැල්මට පැහැදිලි වෙයි. ඒ ගැන කථාව පසෙකට තබා අදාල කෘතියේ කතුවරයා පිළිබඳ මදක් විමසා බැලීම වටීයැයි සිතේ. ඩී. බී. කුරුප්පු යන නාමය සාහිත්‍ය ක්‍ෂේත්‍රයට අරුමයක් නොවේ. ඔහු සිය ප්‍රථම පරිවර්ථන කාර්ය ''මැංචෝසන් චාරිකා'' නමින් එළිදක්වන්නේ 1963 තරම් ඈත කාලයේදීයි. එය මේ වන විට තෙවන මුද්‍රණයෙන්ද පිටවී අවසාන වීමෙන් වටහාගත හැක්කේ එයට ඇති ඉල්ලුමයි.

අඩසිය වසකට වැඩි කාලයක් අඛණ්ඩව ග්‍රන්ථකරණයේ යෙදී සිටින ඩි.බී. කුරුප්පු මහතා හැම විටම නවමු අද්දැකීමක් සිය පාඨකයින්ට ලබාදීමට උත්සුක වන සාහිත්‍යධරයෙකි. විවෘතව නොපැකිලව සිය අදහස් ප්‍රකාශ කිරීමෙහිලා එතුමා සතුව ඇත්තේ මනා පරිචයකි. එය අගය කළයුතු ප්‍රශස්ථ සීමාවද ඉක්ම යනු බොහෝ විට පෙනෙන්නට තිබේ.

සිංහල ග්‍රන්ථකරණයේ දක්නට ලැබෙන ප්‍රවණතාවය වන්නේ බටහිර විචාර සංකල්ප තහවුරු වන අයුරින් නිර්මාණකරණයට පෙලඹීමයි. එහෙත් ලේඛකයෙකු සිදුකළ යුත්තේ විශ්ව සාහිත්‍ය ඇසුරු කළද, ඒ කෝව තුළ සියට සිය අද්දැකීම් ඇතුළු කිරීම නොව, දේශීය අනන්‍යතාව සුරැකෙන පරිදි නිර්මාණකරණයට යොමු වීමයි. ඩී. බී. කුරුප්පු එවැනි උත්සාහයක නිරත වන ලේඛකයෙකු බව ඔහුගේ 'පිරිමි ජාතිය උතුම් ජාතිය' නම් කෘතියෙන් පැහැදිලි වෙයි.

දේශීය අනන්‍යතාව සහ පොදුජන විඥානයට ගැලපෙන ආකාරයේ සිය අදහස් නිර්මාණාත්ක ලෙස ඉදිරිපත් කිරීමට හෙතෙම විශ්ව ප්‍රවනතා, උදාහරණ ප්‍රවේසමෙන් තෝරාබේරා ගෙන ඉදිරිපත් කරන්නේ ජපානයේ පෙරළිකාර ලේඛකයෙකු වන 'හරුකි මුරකමි' සිහියට නංවමිනි. ලාංකීය සමාජයේ මෙන්ම ගෝලීය සමාජයේ සංස්කෘතික විඥානය සුක්ෂම ලෙස උකහා ගැනීමට කුරුප්පු මනා සුරුකමක් දක්වන්නේ ඔහුගේ දැනුමේ වපසරිය පිළිබඳව අපද දැනුවත් කරමිනි. අන් අයගේ ඇසට හසුනොවන සමාජයේ ලුහු තැන්, හිස් තැන්, ඇදපළුදු වූ තැන් ඉතාමත් ගැඹුරු විචාර බුද්ධියකින් අනුදැන ග්‍රන්තාරූඪ කිරීමෙන් ඔහු දැනුවත් කරන්නේ බසෙහි පසුගාමි අපේ පරම්පරාවයි. ඔහු අරඹයා ඉගෙනුමට බොහෝ තැන් ඇති බව ඔහුගේ ග්‍රන්ථ පරිශීලනයෙන් අපට පැහැදිලි වෙයි.

ඔහුට සතුරන්ද මිතුරන් නැති වග හැගෙන්නේ දුර්වලතැනක් දුටු සැනින් කිසිදු අනුකම්පාවකින් තොරව ඊට දැඩි ප්‍රහාරයක් එල්ල කිරීමෙන් නොනැවතී එය මතු පරපුරට පරිශීලනය පිණිස ග්‍රන්ථාරූඪ කරන ආකාරයෙනි. මෙවන් අදීන ලේඛකයන් අද ග්‍රන්ථකාර්ය තුළ විරලය. හිතමිතුරන්ගේ අතින් සිදුවන වරද, වරදක් නොවේයැයි සිතා සිටින්නන් අතර ඔහු සුවිශේෂීය. ඔහුට මිතුරාද, සතුරාද අදාල නැත. පහර දිය යුතු තැන නොබියව පහර දෙයි.

ගත්කතුවරයෙකුගේ අනන්‍යතාව හෝ ස්වීයත්වය රැකගත හැක්තේ සිය දේශයේ සංස්කෘතිය විඥානය ඉස්මතු කෙරෙන ආකාරයෙන් නිර්මාණය සම්පාදනය කළ විට යි. සංස්කෘතික විඥානය නිරූපනය කිරීම අවර ගණයේ සාහිත්‍ය ලක්ෂණයක් ලෙස සලකීමට පෙළඹී සිටින ලාංකේය නිර්මාණකරුවන්ට ඩී. බී. කුරුප්පු මෙම ග්‍රන්ථයෙන් එල්ල කරන්නේ දැඩි අතුල් පහරකි.

සිදුවන අනිටු විපාක තඹ දොයිත්තකට මායිම් නොකර ඔහු දෙබරයට ගල් ගසයි. විවාදපන්න අදහස් දෙවරක් නොසිතා ග්‍රන්ථාරූඪ කරයි. ඔහු තුළ මා දකින අනෙක් අපූර්රත්වය අතීත සිදුවීම් දින වකවානු සහිතව මැනවින් මතක තිබීමයි. මේ අටුකා ටීකා මා ලියුවේ මා කතා කිරීමට සැරසෙන ප්‍රධාන මාතෘකාවට ප්‍රවේශයක් වශයෙනි. කලෙකට පෙර ලියන ලද ''පිරිමි ජාතිය උතුම් ජාතිය'' නමැති ග්‍රන්ථය මා අත පත්වූ කළ ඒ ගැන යමක් සන්නස පුවත්පත කියවන සාහිත්‍ය කලාවට ලැදිකමක් දක්වන පාඨකයන් වෙනුවෙන් ලිවිය යුතුමය යන හැඟීම ඇති විය. මන්ද ඉතිහාසයේ, දේශපාලනික, සාමාජීය, ආර්ථික සහ සංස්කෘතික චලනයන් ගැන අවධානයෙන් සිටින ඔබට මෙය කදිම ගතක් වන බැවිනි.

වර්තමානයේ සාහිත්‍ය හෝ විචාරාත්මක කෘති තුළ පාඨකයා අරමුණු කර රචනා වන්නේ පිටු හාර පන්සියය ඉක්මවා යන දැවැන්ත කෘතිය. පොත් ගෙඩි ලිවීම හුදෙක් සාහිත්‍ය සම්මාන අරභයා පටු අරමුණ මතින් සිදුවන්නක් බව පෙනෙයි. ඩී. බී. කුරුප්පු මහතාගේ ග්‍රන්ථය පිටු 152 ක් පමණකි. එහෙත් ඒ තුළ විශාල දැනුම් සම්භා රයක් කැටිව පවතී. ඇතැම් ගත්කතුවරුන් විද්වතුන්, විචාරකයින් ලියූ කෘති පාඨකයින්ට දුරාවබෝධ වීමත් හඳුනා ගත යුතු ලක්ෂණයකි. මෑතකාලින සමහර ලේඛකයින්ගේ කෘති බටහිර කතුවරුන්ගේ හා විචාරකයින්ගේ මතවාද, සාහිත්‍ය සිද්ධාන්ත හා සංකල්ප තහවුරු වන ආකාරයෙන් රචනා වීම නිසා බුද්ධිමතුන්ට පවා ඒවා තේරුම් ගැනීමට සිදුවූයේ මහත් අයාසයෙනි. එහෙත් ඩී. බී. කුරුප්පු මහතාගේ රචනා විලාසය සුමටය. ඔහු ඉදිරිපත් කරන උදාහරණ අවබෝධකරගැනීමට වටිනා තරමට රසවත්ය.

මෙහි ඇති අනෙක් විශේෂත්වය නම් පොතට ලබාදී ඇති නමයි. ''පිරිමි ජාතිය උතුම් ජාතිය''. මේ නම ඇසූ දුටු පමණින් කාන්තා පක්ෂය සිත් රිඳවාගන්නා බව නොරහසකි. ඒ සමඟම කුතුහලයක්ද දනවයි. මේ මුල් පදය කියවන යම් කෙනෙකුට ඊට අදාල පැරණි කව මතකයට නැගෙනු ඇති.

පිරිමි ජාතියක උතුම් ජාතිය
කන්න දීපිය මල් පුදාපිය
ගෑනු ජාතිය ජරා ජාතිය
ගලේ ගහපිය මරා දාපිය

බොහෝ විට මෙවන් කවි වනපොත් කළේද කාන්තාවෝමය. දරුවන්ට කියාදුන්නේ අම්මලාය. ඒ ගැන කිසිදු පසුබෑමක් ඔවුන් තුළ ඇතිනොවූයේ පීතෘ මූලික සමාජයක මෙවන් පද නින්දා සේ නොගත් හුදු රසවිඳීමේ තවත් එක් කවක් පමණක් කොට සැලකූ බැවිනි. එසේ නැතිනම් උගෙනුමෙන්, ජනවහරෙන්, පන්සලෙන්, බණකතාවෙන් මෙය පරම සත්‍යයක් බවට ඈ තුළ පැලපදියම් වූ බැවිනි. මෙය සිය ලිපි පෙළෙහි




තුන්වන ලිපිය ලෙසත් ගතෙහි මුඛ්‍ය පාඨය ලෙසත් ගැනිමෙන් ඩී. බී. කුරුප්පු කරන්නේ දෙබරයකට ගල් ගැසීමක්මය.

එකිනෙකට වෙනස් විවාදාපන්න මෙන්ම බුද්ධිගෝචර ලිපි අටක් මෙම ග්‍රන්ථයට ගොනු කර තිබේ. තෙවන ලිපියෙන් සමාජ අසාධාරණත්වයට පත්වන ස්ත්‍රීත්වය පිළිබඳ ඔහු අදහස් නොබියව දක්වන්නේ ඉන්දීය ලේඛිකා කමලා දාස්ගේ 'මගේ කතාව' මෙන්ම මොනිකා රුවන්පතිරණගේ 'මගේ යෙහෙලිය ඇය ගැහැණිය' පොත්ද සිහි ගන්වමිනි. ගැහැණිය පිළිබඳ තවම අප කරපින්නාගෙන එන සාවද්‍ය පැරණි බමුණු මත ඔහු විච්ඡේදනය කර මෙන්න බලාපල්ලා යැයි අපට දක්වයි.

මාක්ස්වාදයද සමාජවාදයට යන ලිපිය මා හාට මාක්ස්වාදය ගැන බොහෝ කරුණු කාරණා උගෙනුමට ඉහවල් විය. මා මෙතෙක් ඒ පිළිබඳ දරා සිටි යම් අදහස් සැකයකින් තොරව සංස්කරණය කරගැනීමට එය මනා පිටිවහලක් විය. ඩී. බී. කුරුප්පු මහතාගේ ග්‍රන්ථයක් යනු අධ්‍යාපනමය සංසිද්ධියක් බව මනාව පිළිඹිබු වෙයි. අවසානයේ එය පරිශීලනය කරන්නාගේ දැනුම වර්ධනය වෙයි.

යුග කාර්යභාරය, එනම් දේශීය, ජාතික මූලයන් පිළිබඳ අවබෝධය ලේඛකයෙකුට වැදගත්ය. ඔහුට කාලීන සමාජය ප්‍රතිනිරූපණය කිරීමේ වගකීම මෙන්ම සිය දේශයේ හෝ ලෝකයේ හෝ අතීතය අවර්ජනය කිරීමේ වගකීමද පැවරී තිබෙන්නක්.

ඩී. බී. කුරුප්පු සිංහල පරිවර්ථන ග්‍රන්ථ ක්ෂේත්‍රය තුළ ද පරිවර්තනීය වෙනසක් ඇති කල පරිවර්ථකයෙක්. වෙනත් භාෂාවක කෘතියක් සිංහලට පරිවර්තනය කිරීමේදි මුල් කෘතියෙන් විශද වන සමාජ හා සංස්කෘතික මූලයන් නොනැ-



ශ්‍රීනාත් මද්දුමගේ

සෙන සේ එය ඉටුකිරීමටද හේ සමතෙක්. එසේ නොවී නම් ඔහුට පනස් වසරක් සාහිත්‍ය ක්‍ෂේත්‍රයේ රැඳී සිටිය නොහැකියි.

කුතුහලයෙන් යුත් අපූර්ව මාතෘකා අටකින් සැදුම් ලත් කෙටි ලිපි මගින් සන්නද්ධ කළ ඩී. බී. කුරුප්පු මහතාගේ ග්‍රන්ථය එක හුස්මට කියවාගෙන යා හැකි පර්යේෂණාත්මක විචාරශීලි ග්‍රන්ථයක් යන්නයි මගේ හැඟීම. ඔහු තෝරාගෙන ඇති මාතෘකා එකිනෙකට වෙනස්.

නවකතා, කෙටිකතා, පරිවර්ථන බහුලව මුද්‍රණයෙන් පිටකරන ලේඛකයන් බොහෝ වුවත් මෙවැනි පර්යේෂණාත්මක, සිතන්නට යමක් ඉතිරිකරන විචාරශීලි ග්‍රන්ථ වසරකට එක දෙකකට වඩා බිහිවන්නේ නැති වටපිටාවකයි කුරුප්පු මහතා සිය කාර්ය ඉටු කරන්නේ. එය අගය කළ යුතු වන්නේ ඔහු සරල වින්දනීය මාර්ගය තෝරා-නොගන අසීරු දුෂ්කර මඟ තෝරාගෙන වාණිජ අර්ථයට වඩා බුද්ධියට වැඩි තැනක් ලබාදෙන බැවිනුයි.

මේ අනුව අද්‍යතන ගත්කරුවාගේ කාර්යභාරය සුළු කොට තකන්නට බැහැ. අද්‍යතන සමාජය හසුරුවන ප්‍රධානතම බලවේගය වන වාණිජවාදි සරල වින්දනය බැහැර කර ජනතාව මුහුණ දෙන අර්බුද, දුරාබෝධ ගැඹුරින් විග්‍රහ කෙරෙන ග්‍රන්ථයන්ගේ අවශ්‍යතාව වැඩි වැඩියෙන් දැනෙමින් පවතිනවා. ඔහු ඉටු කරන්නේ එම සමාජ ඉල්ලුමයි.

අද්‍යතන සාහිත්‍ය ක්‍ෂේත්‍රයේ පාඨකයාද මුහුණ දී සිටින්නේ යම් අර්බුදයකට. ප්‍රකට විචාරකයෙකු වන 'ස්ටැන්ලි ෆිෂ්' පෙන්වා දෙන්නේ සාහිත්‍ය කෘතියක් ජීවය ලබන්නේ පාඨක සහභාගිත්වයෙන් බවයි. ඉදින් සාහිත්‍යකරුවාගේ වගකීම විය යුත්තේ පාඨකයන්ගේ භාව සසල කිරීම මෙන්ම බුද්ධිය සසල කිරීමට විමසිලිමත් වීමයි. ඒ අතින් ඩී. බී. කුරුප්පු මහතා පෙරමුණෝරාළ කෙනෙකු ලෙස කටයුතු කරන බවනම් නොකියාම බැහැ.

